# 19
# ජුදෙව් සමාජයෙන්

ඉරුදින දේව නමස්කාරයට සහභාගි වී නිවසට පැමිණි අරුල් ගැඹුරු කල්පනාවක නිමග්න ව සිටිනු දුටු ඔහුගේ මව ඒ පිළිබඳ ව විමසුවා ය.

" මොකද පුතා පල්ලි ගිහින් ආපු වේලාවේ හිටන් බරපතළ කල්පනාවක ? "
" දාහට අරන් සීයට දීලා වගේ. "
කොහේදෝ සිට පැමිණි අක්කා ද ඔහු ව වෙහෙසවන්නට වුවා ය.

" අම්මේ අද පල්ලියේ දේශනාවට කිව්වනෙ පැරණි ජුදෙව් සමාජයේ යහපත් වටිනාකම් තිබුණා, ඒවා අද අපේ ජීවිතවලටත් අදාළ කරගන්න කියලා."

" ආ මේකද ප්‍රශ්නේ ? ඉතින් හොඳ දේවල් අපේ ජීවිතවලට අදාළ කරගන්න එක වරදක් දැ " යි පැවසූ අක්කා එතැනින් නික්ම ගියා ය.

" ඒත් අම්මේ ඒක ප්‍රශ්නයක් අපි ඉගෙන ගෙන තියෙන්නේ ජුදෙව් ජාතිය තුළ වර්ග වාදය තිබුණ කියලා. "

" ඕනෑ ම සමාජයක හරි ඕනෑම කෙනෙකුගෙන් හරි යහපත් වටිනාකම් ලබාගෙන අයහපත් දෑ බැහැර කරන එකයි සිදු විය යුත්තේ."

සාකච්ඡාවට සවන් දෙමින් කාමරයේ සිටි පියා සාලයට එමින් පැවසුවේ ය.

අරුල් තුළ පැණ නැගුණු ප්‍රශ්නයත් පියා ඊට දුන් පිළිතුරත් වැදගත් ය. ඕනෑම සමාජයක යහපත් සාරධර්ම මෙන් ම අයහපත් ලක්ෂණ ද දැකිය හැකි ය.

ද්විතීය නිතී සංග්‍රහයේ 7 වන පරිච්ඡේදයේ 6 7 දක්වා වන පද අනුව දෙවිඳුන් විසින් ඊශ්‍රායෙල්වරුන් තෝරා ගනු ලැබුවේ අන්‍යයන්ට යහපත් ගුණ ධර්ම ප්‍රදානය කිරීම සඳහා ය. දිවැසිවර මඟ පෙන්වීම අනුව හැඩ ගැසුනු ජුදෙව් සමාජය තුළ යහපත් වටිනාකම් රැසක් දැක ගත හැකි විය.

## ජුදෙව් සමාජයේ පැවති යහපත් වටිනාකම්

1. ගැඹුරු ඇදහිල්ල
2. ආගන්තුක සත්කාරය ( උත්පත්ති 18 )
3. භූමිය පරම්පරානුගත ව බෙදා ගනු ලැබූ අතර විකිණීමට වූ අකමැත්ත (1 රාජාවලිය 21 )
4. ජුබිලි වර්ෂය ( ලෙවී ව්‍යවස්ථාව 25 )
5 උදාර මනුෂ්‍යත්වය
6. විස්තෘත පවුල් ක්‍රමය

දිවැසිවර මඟ පෙන්වීම අනුව ජුදෙව් සමාජයේ සෑම අංගයක ම ආගම පැවතුනි. ඔවුන් දෙවිඳුන්ගේ ශික්ෂා අනුව ජීවත් වීමට හුරු වූහ. ඒ නිසා ම ඔවුන් තුළ ගැඹුරු ඇදහිල්ලක් විය.

මෙම ඇදහිල්ලට පදනම් වූයේ ජුදෙව්වරුන් දෙවි සමිඳුන් විසින් තෝරා ගනු ලැබූ විශේෂ ජනතාවක් වීම ය. ටෝරාව (Tora) වැනි සමිඳුන්ගේ විශේෂ ඉගැන්වීම් සහිත ව්‍යවස්ථාව කිසිම පැකිළීමකින් තොර ව ඔවුහු අනුගමනය කළහ.

ඔවුන් ආගන්තුක සත්කාරය සඳහා දැකවූයේ ඉමහත් රුචියකි. තමන්ගේ නිවෙසට එන ඕනෑම කෙනෙකු සුහද ලීලාවෙන් පිළිගෙන ඔවුන්ට සත්කාර කිරීම ජුදෙව් සමාජයේ මුල් බැසගත් සිරිතක් විය. ආදී පීතෘ ආබ්‍රහම් තුමා තමාට හමු වූ දේව දූතයන් හට සත්කාර කොට ඔවුන් සතුටු කළේ එබැවිනි.

භූමිය පිළිබඳ ව ජුදෙව් සමාජය අනුගමනය කළ ක්‍රමය ද වැදගත් විය. භූමිය පරම්පරාවෙන් පරම්පරාවට බෙදාගත් අතර, එය විකිණීම ඔවුන්ගේ අභිලාෂය නොවීය 1 රාජාවලිය 21 වැනි පරිච්ඡේදය අනුව නාබොත් සිය මිදිවත්ත ආහබ් රජුට විකිණීමට අකමැති වූයේ භූමිය පිළිබඳ වූ මෙවැනි අදහස් නිසා ය.

මේ සඳහා බලපෑ සිද්ධාන්තය වූයේ භූමිය දෙවිඳුන්ට අයත් ය යන්න හා මිනිස් ජීවිතය මෙලොව සදාකාලික නොවේ ය යන අදහස ය. එබැවින් භූමිය විකිණීමේ අයිතිය මිනිසා සතු නොවන බව ඔවුහු අවධාරණය කළහ. යම් විටෙක දිළිඳු භාවය හේතු කොට ගෙන භූමිය විකිණීමට සිදු වූවත් ජුබිලි වර්ෂයේ දී එය නැවතත් ලබා ගැනීමේ භාග්‍යය උදාවිණි.

ජුදෙව් සමාජයේ තවත් යහපත් වටිනාකමක් මේ ඇසුරින් පැණ නගී. එනම් ජුබිලි වර්ෂය යි. ජුදෙව් ව්‍යවස්ථාව අනුව අවුරුදු හතෙන් හතට පැමිණෙන සබත් වර්ෂ හතක්, හතෙන් වැඩි කළ විට අවුරුදු 49 ක් ලැබේ. ඉන් පසු උදා වන නව වර්ෂය එනම් 50 වැනි අවුරුද්ද නිදහස් ප්‍රකාශ කළ යුතු සංවත්සර වර්ෂයකි. මෙම ජුබිලි වර්ෂය තුළ දී සෑම කෙනෙකු ම මිළදී ගත් සියල්ල පළමු හිමිකරුට හෝ ඔහුගෙන් පැවතෙන්නන්ට නැවත ලබාදිය යුතු විය. මෙහි අදහස භූමියට පමණක් සීමා නොවිණි. ජීවිතයේ වහල් භාවයන් මුලිනුපුටා දමා, නව අනන්‍යතාවයක් සමඟ, නිදහසේ නව ජීවිතයක් ලබා දීම ද ඉන් අර්ථවත් විය.

උදාර මනුෂ්‍යත්වයෙන් අන්‍යයන් සැලකීම ද ජුදෙව් සමාජයේ පැවති තවත් යහපත් වටිනාකමකි. ඒ නිසා ම දිළිඳුන් සැලකීම ඉස්මතු වූ අතර, කෙනෙකුට ණය මුදලකින් උපකාර කිරීමේ දී පොළියක් ලබා නොගැනිණි.

මව පියා හා දරුවන් යන න්‍යෂ්ටික පවුල් ව්‍යුහයට සීමා නොවූ පවුල, ජුදෙව් සමාජයේ වැදගත් වූයේ වැඩිහිටියන් සැලකීමේ උතුම් ගුණාංගය නිසා ය. විස්තෘත පවුල් ක්‍රමය යටතේ පවුලේ වැඩිහිටියන් පමණක් නොව, වහල්ලු ,විදේශිකයෝ හා කුලී කරුවෝ ද එකම පියස්ස යට වාසය කළහ.

## ජුදෙව් සමාජයේ පැවති අයහපත් අංග

අරුල් පැවසූ ලෙස වර්ගවාදය වැනි අයහපත් ලක්ෂණ ද ජුදෙව් සමාජයේ විය. එසේ වූයේ ඔවුන් අනුගමනය කළ බහිෂ්කාරවාදී අදහස් නිසා ය. ඔවුන් දෙවිඳුන් විසින් තෝරා ගනු ලැබූ හෙයින් විශේෂිත ජන වර්ගය ලෙස සැලකිණි. පිරිසිදු ජාතියක් ය යන අභිමානයෙන් පෙළීම නිසා අන්‍ය ජනතාව නිගරුවට භාජනය විය. බහිෂ්කාර වාදය (exclusivism) අනුව ඔවුන්ගේ සිතුවිලි හා අදහස් නිවැරදි බවත් සෙසු අයගේ චින්තනයන් බැහැර කළ යුතු බවත් ජුදෙව් අය සිතූහ. ජෙරමියා 29 : 5 7 පදවලට අනුව බබිලෝනිවරුන් සමඟ ප්‍රසිද්ධියේ ජීවත් වීමට හා ඔවුන් සමග මිශ්‍ර වීමට දෙවිඳුන් විසින් ඊශ්‍රායෙලිතයන් පාවිච්චි කරනු ලැබුවේ වර්ග වාදයෙන් ඔබ්බට ගමන් කරවීම සඳහා ය. ජුදෙව් වර්ග වාදයෙන් බැහැර වීම පිළිබඳ ව වැදගත් තැනක් දෙවිඳුන් දුන් බව ජෝනා හා රූත්ගේ කථාවලින් ද පැහැදිලි ය.

පුරුෂාධිපත්‍යය ජුදෙව් සමාජයේ මුල් බැස ගත් අයහපත් අංගයක් විය. කාන්තාවට එහි තැනක් නොවිණි. සියලු තීරණ ගනු ලැබුවේ පියා විසිනි. පිරිමි දරුවන්ට ධර්ම ශාලා මඟින් පවත්වන ලද පාසල් වල ජුදෙව් ව්‍යවස්ථාවලිය අධ්‍යයනය කළ හැකි වුවත් ගැහැණු දරුවෝ නිවෙස් තුළ ම ආගමික පෝෂණයක් ලැබූහ.

''ස්වාමීනි , ඔබවහන්සේ මා අන්‍ය ජාතිකයකු හෝ කාන්තාවක ලෙස නොමැවූ නිසා ඔබවහන්සේට ස්තුති කරමි. ''

ජුදෙව් සමාජයේ ප්‍රචලිත යැදුමක් වූ මේ මඟින් ඔබට හැඟෙන්නේ කුමක් දැ යි සිතා බලන්න.

## දිවැසිවරුන් හා ජුදෙව් සමාජය

දිවැසිවරුන් හා ජුදෙව් සමාජ ජීවිතය අතර යහපත් සබඳතාවක් පැවතියේ ජුදෙව් යහපත් වටිනාකම් ඉදිරියට ගෙන යාමටත්, අයහපත් ගති පැවතුම් බැහැර කිරීමටත් දිවැසිවරුන් මූලිකත්වය ගත් බැවිනි.

ජුදෙව් වර්ගවාදය දිව්‍යසිවරු දැඩි ලෙස හෙළා දුටුවෝ ය. පර්සියාවේ සයිරස් රජු රාජ්‍යත්වය සඳහා දෙවිඳුන් විසින් ආලේප කරනු ලැබූ බව යෙසායා දිව්‍යසිවරයා පැවසූවේ අලේප කිරීම ජුදාගමික සීමාවන් ඉක්මවා යන්නක් වූ බැවිනි. දෙවියන් වහන්සේට තම මැවිල්ලේ ඕනෑම කෙනකු දෙවියන් වහන්සේගේ කාර්යය ඉෂ්ට කිරීම සඳහා යොදවා ගත හැකි බව ද යෙසායා දිව්‍යසිවරයා ඉගැන්වූයේ ය.

## ජේසුස් වහන්සේ හා ජුදෙව් වටිනාකම්

ජේසුස් වහන්සේ ජුදෙව් වටිනාකම් යොදා ගනිමින් ජුදෙව් සමාජය ප්‍රතිසංස්කරණය කළ සේක. සබත් දින නිවාඩු ගැනීමට වඩා මානව යහපත උදෙසා කැප කළ යුතු බව උන්වහන්සේ පෙන්වා දුන්නේ එහි පියවරක් ලෙස ය. උදාර මනුෂ්‍යත්වය ජේසුස්වහන්සේ අගය කළ සේක. අන්‍යයන්ගේ නිවැරදි අදහස් පිළිගැනීමටත් යථාර්ථවාදී ව ජීවත්වීමටත් උන්වහන්සේ ජනතාව යොමු කළ සේක.

## වර්තමාන අභියෝග

බහු වාර්ගික බහු ආගමික සමාජයක් තුළ අද අපි ජීවත් වෙමු. මෙම සමාජයේ සාමකාමී සහජීවනය වර්ධනය කිරීම අත්‍යවශ්‍ය ය. ඒ සඳහා අපගේ ජීවිතවලට අනුගත කරගත යුතු ජුදෙව් වටිනාකම් කවරේ දැ යි සිතා බලන්න................

ඒ අතර 2000 වසරේ ලෝක බැංකුව මගින් ණය ලබා ගත් රටවල් ණය බරින් නිදහස් කිරීම සඳහා වූ ආයාචනයේ ප්‍රායෝගිකත්වය පිළිබඳ ව ද ඔබගේ අවධානය යොමු කරන්න ...............

සමානාත්මතාවය පදනම් කරගත් සියලු දෙනාට එකමුතු ව ජීවත්විය හැකි නව සමාජයක් බිහි කර ලීමට මෙම වටිනකාම් ඉවහල් කරගනනේ කෙසේ ද? යන්න පිළිබඳවත් සිතා බලන්න.........

ජුදෙව් සමාජයේ පැවැති අයහපත් අංග වර්තමාන ශ්‍රී ලාංකේය සංදර්භයට ගැළපෙන අයුරින්, වඩාත් යහපත් ශ්‍රී ලංකාවක් සඳහා යහපත් ලෙස වෙනස් කර ගත හැක්කේ කෙසේ ද? යන්න පිළිබඳ ව ඔබගේ සැලකිල්ල යොමු කරන්න................

(බහිෂ්කාරවාදය (Exclusives) යනු බැහැර කිරීම යි. මේ අනුව අන්‍ය අදහස් සියල්ල ම බැහැර කරන ලදි.)

❖ **ඇගැයීම :-**

1. ජේසුස් වහන්සේ ජුදෙව් සමාජය ප්‍රතිසංස්කරණය කළාක් මෙන් අප වර්තමාන ශ්‍රී ලාංකීය සමාජය වෙනස් කළ යුත්තේ කෙසේ දැ යි පැහැදිලි කරන්න.

2. ඒ සඳහා ජුදෙව් සමාජයෙන් ගත හැකි ආදර්ශ කවරේ ද?